# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා විසින්
2021 ජුනි මස 23 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 මැයි මස 18 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[54 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන සංගමයක්, එකී සංගමය හා සම්බන්ධ සියලුම කාරණා ඵලදායී ලෙස පවත්වාගෙන යාමේ හා ඒවා සම්බන්ධයෙන් කටයුතු කරගෙන යාමේ කාර්යය සඳහා මෙහි මින් පෙර ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවන ලද්දේ යම් අරමුණු හා කාරණා සම්බන්ධයෙන් ද, එම අරමුණු හා කාරණා කිහිපය, එකී සංගමය විසින් මෙහි මින් පෙර සාර්ථක ලෙස පවත්වාගෙන යාම හා ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම සිදුකර ඇති අතර, එය, පාර්ලිමේන්තුවේ පනතක් මගින් සංස්ථාපනය කරනු ලැබීම සඳහා ඉල්ලීමක් කර ඇති හෙයින් සහ එම ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය**

**1.** මේ පනත 2021 අංක    දරන ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්ව සංගමය සංස්ථාගත කිරීම**

**2.** මේ පනත ආරම්භ කිරීමේ දින පටන් හා ඊට පසුව, දැනට සිටින යම් තැනැත්තන් සංඛ්‍යාවක් (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වයේ සාමාජිකයන් වීම හෝ මෙයින් පත් කරනු ලබන සංස්ථාවේ සාමාජිකයින් වශයෙන් ඇතුළත් කර ගැනීම සිදු විය යුතු ය. තව ද එම සංගමය, "ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහිතව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරන ලබන) සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීම හා පාවිච්චි කිරීම සහ ස්වකීය අභිමතය පරිදි එම මුද්‍රාව වෙනස් කිරීම සඳහා වූ පූර්ණ බලය හා අධිකාරය සහිතව එම නාමයෙන් සියලුම අධිකරණයන්හි නඩු පැවරීම හා ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම එය විසින් කළ හැක්කේ ය.

සංස්ථාවේ පොදු අරමුණු

**3.** සංස්ථාව පත් කරනු ලැබුවේ යම් පොදු අරමුණු සඳහා ද, එම පොදු අරමුණු මෙයින් මෙසේ ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) අපගේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් ශුද්ධ වූ බයිබලයේ බලය පවරා ඇති පරිදි මැතිව් සාන්තුවරයාගේ ග්‍රන්ථයේ 28 වන පරිච්ඡේදයේ 18 සිට 20 දක්වා වූ ගීතිකාවල සහ මාර්ක්ගේ ග්‍රන්ථයේ 16 වන පරිච්ඡේදයේ 16 සිට 20 දක්වා වූ ගීතිකාවල අඩංගු උන්වහන්සේගේ පූර්ණ ශුභාරංචිය ප්‍රකාශයට පත් කිරීම හා නිවේදනය කිරීම;

(ආ) ශුද්ධ වූ බයිබලයේ ලියා ඇති පරිදි අපගේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණ ශුභාරංචිය විශ්වාස කරන්නා වූ හා පිළිගන්නා වූ සහ අපගේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ස්වකීය පුද්ගලික ගැලවුම්කාරයාණන් වහන්සේ වශයෙන් ස්ථිර ලෙස ප්‍රකාශ කරන්නා වූ ද තැනැත්තන් සංගමයේ සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගැනීම;

(ඇ) ශුද්ධ වූ බයිබලයේ දේව වාක්‍යයේ ආඥා කර ඇති පරිදි ඇදහිලිවන්තයන්ගේ සභාවක් වශයෙන් (ආත්මයෙන් හා සත්‍යයෙන්) එකට එක්ව අපගේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට නමස්කාර කිරීම සඳහා සංගමයේ සාමාජිකයන්ට සහාය වීම;

(ඈ) ශුද්ධ වූ බයිබලය දේව වාක්‍යයේ ආඥා කර ඇති පරිදි ඇදහිලිවන්තයන්ගේ සභාවක් වශයෙන් (ආත්මයෙන් හා සත්‍යයෙන්) එකට එක්ව අපගේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේට නමස්කාර කිරීම සඳහා සංගමයේ සාමාජිකයන්ට හැකියාව ලබා දීම;

(ඉ) පාපයෙන්, අසනීපයෙන් හා දුක් විඳීමෙන් ගැලවීම ඇතුළුව පූර්ණ ගැලවීම සම්බන්ධයෙන් හිමිකම් පෑම සඳහා සංගමයේ සාමාජිකයන්ට හැකියාව ලබා දීම සහ ඒ මගින් ශුද්ධ වූ බයිබලයේ දැක්වෙන පරිදි අපගේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සියලුම පෙරොන්දු උදෙසා හිමිකම් පෑම මගින් ආධ්‍යාත්මික වශයෙන් සමෘද්ධිය කරා ළඟා වීමට එම සාමාජිකයන්ට සහාය වීම;

(ඊ) පෝල් සාන්තුවරයාට අනුකූලව ශුද්ධ වූ බයිබලයේ අණ පනත් ග්‍රන්ථයේ බලය පවරා හා ආඥා කර ඇති පරිදි ක්‍රිස්තියානි ශුභාරංචි ලබ්ධිය විශ්වාස කරන්නා වූ සහ බයිබලයට අනුගතව ශික්ෂණය ඇති කිරීම හා ක්‍රිස්තියානි දේවස්ථාන පිහිටුවීම මගින් ක්‍රිස්තියානි ශුභාරංචි ලබ්ධිය පතුරුවාලීම සඳහා කැප වී සිටින්නා වූ ද සාමාජිකයන් සඳහා ඉරිදා පාසල්, බයිබල් විද්‍යාල, විවේක හා සම්මන්ත්‍රණ මධ්‍යස්ථාන සහ ශ්‍රාවක පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම;

(උ) දේවස්ථානයේ විශ්වාසවන්ත දේවගැතිවරුන් පත් කිරීම සඳහා වූ අයිතිය හෝ එවැනි අයිතීන් මෙම සංගමයෙන් ලබා ගැනීමට කැමති දේවස්ථාන සභාවේ වෙනත් සේවකයන් පත් කිරීම සඳහා වූ අයිතිය තහවුරු කිරීම;

(ඌ) ශ්‍රී ලංකාවේ හෝ පිටරටවල ධර්මය පිළිබඳව සමාන පරමාර්ථ ඇත්තා වූ ක්‍රිස්තියානි සභා සමග අනුබද්ධ වීම;

(එ) ක්‍රිස්තියානි ආගම පිළිබඳව ග්‍රන්ථ, විෂයානුබද්ධ නිබන්ධන, වාර සඟරා, සඟරා, ප්‍රවෘත්ති පත්‍ර හා ප්‍රවෘත්ති ලිපි මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම හා බෙදා හැරීම;

(ඒ) අපගේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් සම්බන්ධයෙන් මහජන ශුභාරංචි රැස්වීම්, සාකච්ඡා, සම්මේලන හා සංගායනා පැවැත්වීම;

(ඔ) ප්‍රජාවගේ වාර්ගික හෝ ආගමික දෘෂ්ටීන් ගැන නොතකා ඔවුන් සියලු දෙනාගේම ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන, මොන්ටිසෝරි පාසල්, වෘත්තීය පුහුණු ආයතන, වෛද්‍ය මධ්‍යස්ථාන හා ප්‍රජා සංවර්ධන ස්වාභාවයකින් යුක්ත එවැනි වෙනත් ව්‍යාපෘතීන් පිහිටුවීම; සහ

(ඕ) ඉහත කී අරමුණු හෝ ඒවා අතුරින් කවර වූ හෝ එක් අරමුණක් සාක්ෂාත් කර ගැනීම පිණිස ආනුෂංගික හෝ හේතුපාදක වන්නා වූ වෙනත් යම් සියලු ක්‍රියා සහ දේවල් සිදු කිරීම.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල**

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ අරමුණු මුදුන්පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම හා වසා දැමීම, ඇපයක් ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීම හෝ එකතු කිරීම, සංගමයේ අරමුදල් ආයෝජනය කිරීම සහ නිලධාරීන් හා සේවකයන් බඳවා ගැනීම, සේවානියුක්තියේ යෙදවීම හා සේවයෙන් පහ කිරීම සඳහා වූ බලය ඇතුළුව සංස්ථාවේ අරමුණු හෝ ඒවා අතුරින් එක් අරමුණක් වැඩිදියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම පිණිස අවශ්‍ය හෝ අභිමත පරිදි යම් ක්‍රියා, කාරණා හා කවර වූ හෝ දේවල් සිදු කිරීම, ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා වූ බලය සංස්ථාවට තිබිය යුත්තේ ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම**

**5.** (1) සංස්ථාවේ රීතිවලට යටත්ව, නිලතල දරන්නන්ගෙන් හා එම රීතිවල විධිවිධාන සලසා තිබිය හැකි හා ඒවා අනුව තෝරා පත් කරගනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තන්ගෙන් සමන්විත වන්නා වූ කළමනාකාර කමිටුවක් මගින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු වන්නේ ය.

(2) මෙම පනත ආරම්භ කිරීමේ දිනට පෙර දිනයේ දී නිලතල දරන කළමනාකාර කමිටුව, සංස්ථාවේ පළමුවන කළමනාකාර කමිටුව විය යුතු වන්නේ ය.

**සංස්ථාවේ රීති**

**6.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි අරමුණු මුදුන්පමුණුවා ගැනීම පිණිස, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, ඔවුන් විසින් ඉල්ලා අස්වීම, විශ්‍රාම යාම හෝ ඔවුන් නෙරපීම සඳහා ද, කළමනාකාර කමිටුවේ නිලතල දරන්නන් තෝරා පත්කර ගැනීම සඳහා සහ සංස්ථාවේ කටයුතුවල දී සහ සාමාන්‍යයෙන් අන්‍යාකාරයෙන් පිළිපදිනු ලැබිය යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් සංස්ථාවේ කළමනාකාර කමිටුවේ සහ එහි නොයෙකුත් නිලධාරීන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කර්තව්‍යයන් පවත්වාගෙන යාම සඳහා ද මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනි නොවන්නා වූ රීති, සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ කවර වූ හෝ මහා සභා රැස්වීමක දී සහ පැමිණ සිටින සාමාජිකයන්ගේ හතරෙන් තුනකට නොඅඩු ඡන්ද බහුතරයකින් සම්පාදනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සම්පාදිත සංස්ථාවේ කවර වූ හෝ රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම මහ සභා රැස්වීමක දී පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් හතරෙන් තුනක ඡන්දයකින් හැර සහ කළමනාකාර කමිටුව විසින් කලින් අනුමත කර තිබේ නම් මිස, එසේ වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකළ යුතු ය.

(3) මෙම පනත ආරම්භ කිරීමේ දිනට පෙර දිනයේ දී බලාත්මකව පවත්නා සංගමයේ රීති, මෙම පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනි නොවනතාක් දුරට, ඒවා මෙම වගන්තිය යටතේ සම්පාදිත සංස්ථාවේ රීති වශයෙන් සැලකිය යුත්තේ ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු වන්නේ ය.

සංගමය සතු චංචල සහ නිශ්චල දේපල

**7.** එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්ව සංගමය සතු වූ සියලුම චංචල හා නිශ්චල දේපළ මින් මතු ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය සංස්ථාව සතු විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල තබා ගත හැකි බව

8. මෙම පනතේ කාර්ය සඳහා යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, බූදල් නියාදනයක් මගින් හෝ අන්‍යාකාරයෙන් සංස්ථාවට පවරනු ලැබිය හැකි කවර වූ හෝ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා තබා ගැනීමට සංස්ථාවට නීතිමය වශයෙන් හැකියාව තිබිය යුතු වන අතර, එවැනි දේපළ සියල්ලම සංස්ථාව විසින් තබා ගත යුතුවාක් මෙන්ම, සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒවා විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයෙන් සුදුස්සක් කොට බැහැර කිරීම සඳහා සංස්ථාවට පූර්ණ බලය තිබිය යුතු වන්නේ ය

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේද යන වග

**9.** කළමනාකාර කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට හැර, සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තව ද එම සාමාජිකයන් විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එම සාධන පත්‍රය ඔවුන් විසින් ඔවුන්ගේ නම් යොදා අත්සන් කළ යුතු වන අතර, එසේ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමට ස්වාධීනව පැවතිය යුත්තේ ය.

ජනරජයේ සහ වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

10. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගේ හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් දේශපාලන හෝ සංස්ථා මණ්ඩලයක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම් කෙරෙහි මෙම පනතේ අන්තර්ගත කිසිවකින් අගතියක් හෝ බලපෑමක් ඇති නොවිය යුත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

11. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.